# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2079/37 - 2018 ජූලි මස 11 වැනි බදාදා - 2018.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 5/83 II

**1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනත**

11 වන වගන්තිය යටතේ වූ නියමය

1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 11 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්, ජයකොඩි ආරච්චිගේ සුමිත් වන මා විසින්, මහජනයාගේ හිත පිණිස සහ පළිබෝධනාශක තාක්ෂණික හා උපදේශක කමිටුවේ උපදේශය මත මේ නියමය මගින්, ඉහත පනතේ 11 වන වගන්තිය යටතේ සාදන ලද සහ 2015 ඔක්තෝබර් මස 23 වන දිනැති අංක 1937/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය පරිච්ඡින්න කරනු ලැබේ.

ආචාර්ය ජේ. ඒ. සුමිත්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්.

2018 ජූලි මස 11 වැනි දින,
පේරාදෙණිය.

07 - 833